පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය-නර්තනය

දෙවන වාරය - මැයි - සතිය - 02

සැකසුම:-එම්.කේ.සී දිල්රුක්ෂි මිය
ර/නිවි/ලෝකදෙණිය විද්‍යාලය, කරවිට

ශ්‍රේණිය-9

**1.පාඩම හෝ ඒකකය** :- 3.1 **සතර බීජාක්ෂර මුල් කර ගනිමින් සරඹ පද වාදනය සහ මැදුම් තති තිතට අයත් බෙර පද වාදනය කරයි.**

**2.ශිෂ්‍යා කළ යුතු කාර්යන් :-.**

- කියවීම් පත්‍රිකාවට අදාල උපදෙස් සටහන් කරගන්න.
- බෙර වාදනයට සඳහා මූලික වන සතර බීජාක්ෂර හා බෙර සරඹ හඳුනා ගන්න.
- කිහිප වරක් නිවැරදි ව තාල තබා කීමෙන් දුර්වලතා මඟ හරවා ගත හැකියි.
- එම සරඹ ඔබ ලඟ ගැටබෙරයක් ඇත්නම් ඒ මගින් හෝ අත්දෙකෙන් පාද වල ඉහල කොටසට තට්ටු කරමින් පුහුණු වන්න.
- සමගුණ දෙගුණ සිව්ගුණ පුහුණු වීමෙන් සුරල් වාදන හැකියිව ලැබේ.
- පහත link භාවිතා කරන්න.)

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත්පත් ,website ,LMS ,පාඩම් හා ඉගෙනුම් ආධාරක :-**

- **e-තක්සලාව- 09 ශ්‍රේණිය**
- **e-නැණපියස :- 09 ශ්‍රේණිය නර්තනය**
- **you Tube- පහත දැක්වෙන link යොදා ගන්න. https://you.be/xvt8EO-4YjE මෙය වෛරෝඩි වන්නමේ බෙර පද වාදනයයි. එහි ජිං ගත ගොගො වාදනය වන ආකාරයට අවධානය යොමු කරන්න.**
- **කියවීම් පත්‍රිකාව**

**<u>උඩරට බෙර වාදනයේදී පද වාදනය කරන ආකාරය</u>**

**<u>තත්තඩ</u> :- තත්** යන්න බෙරයේ වම් ඇසෙනුත් **කඩ** යන්න දකුණු ඇසෙන් **ක** යන්න සුළැඟිල්ලේ සිට මැදඟිල්ල දක්වාත් **ඩ** යන්න දබරැඟිල්ල වදින සේ වාදනය කල යුතුයි.

**<u>ජිංකඩ</u> :- ජිං** යන්න දකුණු බෙර ඇසේ දකුණතේ සුළැඟිල්ලේ සිට මැදඟිල්ල දක්වා කොටස භාවිතා කරමින් දකුණු බෙර ඇසේ මැදට ගසන්න.වම් බෙර ඇසේ වම් අතේ ඇඟිලි වලින් පෙර පරිදි **කඩ** යන්න වාදනය කරන්න.

**<u>තොංකඩ</u> :-තොං** යන්න බෙරයේ වමෙන් වාදනය කල යුතු අතර අතේ මාපට ඇඟිල්ල හැර අනෙක් ඇඟිලි හතර එක් කොට කැපුම් හම ආසන්නයට වාදනය කරන්න. **කඩ** යන කොටස පෙර පරිදි වේ.

**<u>නංකඩ</u> :- නං** යන්න සුළැඟිල්ලේ සිට මැදඟිල්ල තෙක් ඇඟිලි තුන එකතු කොට අත්ල මදක් ඉහළට ඔසවා බෙරයේ මැද කොටසත් කැපුම් හමත් අතරට ගැසිය යුතුය. **කඩ** යන කොටස පෙර පරිදි වේ.

**පදය :- <u>ජිං ගත ගොගො</u>**

**ජිං-** සුළැඟිල්ලේ සිට මැදඟිල්ල තෙක් ඇඟිලි තුන එක් කොට බෙරයේ දකුණු ඇසේ ඉහළට හඬ විහිදී යන සේ වාදනය කිරීම

**ග-** මහපට ඇඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතරම එක් කොට බෙරයේ වම් ඇසට වාදනය කිරීම

**ත-** මහපට ඇඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතර එක් කොට බෙරයේ දකුණු ඇස මැදට වාදනය

**ගොගො-**අතේ මහපට ඇඟිල්ල හැර ඉතිරි ඇඟිලි හතර එක්කොට කැපුම්හම ආසන්නයට වාදනය කිරීම

- **පොත් පත් /සඟරා**
  අතිරේක කියවීම් අත්පොත(ජාතික අධ්‍යාපන ආයතනය)
  ඥානසිරි පීරිස් මහතාගේ 9 ශ්‍රේණිය නර්තනය කෘතිය



**4.මෙම සතිය තුළ නියමිත පාඩම් වලින් ලබාගත යුතු ඉගෙනුම් ඵලඃ-**

- සතර බීජාක්ෂර මුල් කරගත් සරඹ පද තාල තබමින් කියයි.
- එම සරඹ පද තාලයට අනුව ගායනය කරයි.
- මාත්‍රා 3+3 තාලයට අයත් බෙර පද නම් කරයි.
- එම බෙර පද තාල තබා කියයි.
- ඒකල හා සමූහ වශයෙන් බෙරපද වාදනය කරයි.

**5.ඇගයීම/තක්සේරුකරණ ක්‍රමවේදඃ-**

1. උඩරට බෙරයෙන් වාදනය කරන බෙර සරඹ හා බෙර පද නම් කරන්න.
2. වාදනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් වාදනය ඉදිරිපත් කරන්න.
3. වාදනය ආරම්භයේ සහ අවසානයේ දී කරනු ලබන චාරිත්‍ර විධි අනුගමනය කර දක්වන්න.

4.සංයමයෙන් යුතුව වාද්‍ය භාණ්ඩ පරිහරණය කිරීමේ වැදගත්කම දක්වන්න.

********